## මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017

---

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2012 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - 105 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මුදල් අමාත්‍යාංශයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වර්තමානයේ තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ නැගෙනහිර, වයඹ, මධ්‍යම හා සබරගමුව පළාත් සභා, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සෞඛ්‍ය, වෛද්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීම හා ද්විතියික මට්ටමේ රෝහල්වල හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පහසුකම් හා උපකරණ වැඩිදියුණු කිරීම මඟින් අත්‍යවශ්‍ය ඖෂධවල නිෂ්පාදන ධාරිතාවය ශක්තිමත් කිරීම හා එමඟින් බෝ නොවන රෝග කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබාදීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,332 කට සමාන ජපන් යෙන් මිලියන 4,760 ක් වන අතර එයින් රු.මිලියන 5,155 කට සමාන ජපන් යෙන් මිලියන 3,935 ක් සැපයීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජූලි 23 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිළදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපය ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **මතය**

**-----**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මා වෙත සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 3,935 | 5,155 | 1,154 | 707 | 992 | 3,161 | 4,006 |
| ශ්‍රීලංර | 825 | 1,177 | 280 | 186 | 252 | 789 | 1,075 |
| **එකතුව** | **4,760** | **6,332** | **1,434** | **893** | **1,244** | **3,950** | **5,081** |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) උපයෝජන ලේඛනය අනුව, රු. මිලියන 5,155 කට සමාන ජපන් යෙන් මිලියන 3,935 ක මුළු අරමුදල් 2019 ජූලි 23 දින දක්වා උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබූ අතර ඉන් රු. මිලියන 4,006 කට සමාන ජපන් යෙන් මිලියන 3,161 ක් ව්‍යාපෘතිය විසින් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

(ආ) 2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව සංවර්ධනය කිරීම සහ තෙල්දෙණිය මූලික රෝහලේ සංවර්ධනය සඳහා පිළිවෙලින් රු. මිලියන 1,092 ක් සහ රු. මිලියන 16 ක වෙන්කිරීම් සිදු කර තිබූ අතර ඉන් පිළිවෙලින් රු. මිලියන 934.40 ක් හා රු.මිලියන 11.42 ක් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

ව්‍යාපෘති ලේඛන අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ලෙස සබරගමුව, වයඹ, මධ්‍යම හා නැගෙනහිර පළාත්වල මූලික රෝහල් 4 ක ධාරිතා වර්ධනය සහ පහසුකම් හා උපකරණ වැඩිදියුණු කිරීම තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ධාරිතාව ශක්තිමත් කිරීම යන ඒවායින් සමන්විත විය. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වරකාපොළ, ගල්ගමුව, තෙල්දෙණිය හා කලවංචිකුඩි මූලික රෝහල්හි සිවිල් ඉදි කිරීම් කටයුතු මාස 1 සිට මාස 14 දක්වා වූ පරාසයක කාලය දීර්ඝ කිරීම් සහිතව සම්පූර්ණ කර තිබුණු අතර 2017 ජූලි මාසය අවසන් වන විට මහජනතාව සඳහා විවෘත කර තිබුණි. නොවැළැක්විය හැකි හේතූන් මත ඇතැම් ප්‍රමාදයන් සිදු වූ බවත් පළාත් අධිකාරීන් විසින් කාලය දීර්ඝ කිරීම් අනුමත කර ඇති බවත් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ කාලරාමුව අනුව, ගබඩා ගොඩනැගිල්ල සංවර්ධනය හා යන්ත්‍ර සූත්‍ර නවීකරණය තුළින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීමට අදාළ කටයුතු 2017 මැයි 31 දිනට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් ගබඩා ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 11 දින ප්‍රදානය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට සියයට 75 ක වැඩ කටයුතු අවසන් කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

ව්‍යාපෘතියේ මූලික අදියරේදී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා වූ තෙමහල් ගබඩා ගොඩනැගිල්ල ඉදි කිරීමට අපේක්ෂා කරන ලද ස්ථානය සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අතර ඇතිව තිබූ නොඑකඟතාවක් හේතුවෙන් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව එම ස්ථානය වෙනස් කර තිබුණි. තවද, ඉදිකිරීම් භූමිය මාරු කිරීම හේතුවෙන් රු. මිලියන 5.96 කට සමාන ජපාන යෙන් මිලියන 4.38 ක අතිරේක පිරිවැයක් කොන්ත්‍රාත්කරු විසින් 2017 නොවැම්බර් 15 දින ඉල්ලුම් කර තිබුණි. ස්ථානය වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නියමිත කාල වකවානුව තුළ සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.4 ඌන උපයෝජිත වත්කම්

----------------------------

තෙල්දෙණිය හා ගල්ගමුව යන මූලික රෝහල්හි ඉදිකිරීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණ කර පිළිවෙලින් 2017 අප්‍රේල් 11 හා 2017 ජූලි 20 යන දිනයන්හිදී මහජනතාව සඳහා විවෘත කර තිබුණද, නවීන උපාංගවලින් සමන්විතව තිබූ මෙම රෝහල්හි බොහෝ අංශ පුහුණු කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එම හේතුවෙන් ගල්ගමුව රෝහල තුළ රු. මිලියන 612.56 ක පිරිවැයක් සහිතව ස්ථාපිත කර තිබූ නොමේරු ළදරු ඒකකය, ශල්‍ය දැඩි සත්කාර ඒකකය, රුධිර කාන්දු පෙරණ ඒකකය, නාරි හා ප්‍රසව ඒකකය, හදිසි ප්‍රතිකාර ඒකකය, එන්ඩොස්කොපි ඒකකය සහ දන්ත ශල්‍ය වෛද්‍ය ඒකකය යනාදිය ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව, ගල්ගමුව රෝහලේ ශල්‍යාගාරයෙහි සතියකට දින 02 ක් පමණක් පෙර ලියාපදිංචි කළ රෝගීන් සඳහා පමණක් ශල්‍යකර්ම සිදු කරන අතර හදිසි තත්ත්ව යටතේ කළ යුතු ශල්‍යකර්ම සිදු නොකරයි. තෙල්දෙණිය මූලික රෝහලේ සිවිල් ඉදි කිරීම් කටයුතු සහ ජීව වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 560.72 ක වියදම් දරා තිබුණද, වෛද්‍ය දැඩි සත්කාර ඒකකය සහ ශල්‍යාගාරය 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඌන උපයෝජන තත්ත්වයේ පැවතුණි.